අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

Isurupaya, Battaramulla, Sri Lanka
94112785141-50
info@moe.gov.lk
www.moe.gov.lk


මගේ අංකය / My Ref: ED/04/58/20/ජාතිකපාසල්-SLEAS
ඔබේ අංකය / Your Ref:
දිනය / Date: 2023

වෙත
සම්මුඛ පරීක්ෂණ අංකය

<u>ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති ධූරය දැරිය යුතු ජාතික පාසල් 34 ක විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02 ඒ සඳහා ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ......................................ශාලාවට....................... දින පෙ.ව./ප.ව. ........................ට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එදිනට පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අදාළ සහතිකවල ඡායා පිටපත් (අංක I සිට VII දක්වා ලේඛන) ගොනුවක් පහත සඳහන් අනුපිළිවෙලට සකස් කර ඔබගේ නම හා සම්මුඛ පරීක්ෂණ අංකය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

I. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය
II. ජාතික හැඳුනුම්පත
III. නමෙහි වෙනසක් පවතී නම් පමණක් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශය
IV. සේවා පළපුරුද්ද සනාථ කිරීම සඳහා
   a) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කළ ලිපිය
   b) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කළ දින සිට 2023.04.28 දින දක්වා ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකය - ආකෘති පත්‍ර අංක 01
V. අධ්‍යාපන සුදුසුකම් - ( ලකුණු පටිපාටියේ අනු අංක 02 අනුව)
VI. සේවා ඇගයීම - (ලකුණු පටිපාටියේ අනු අංක 05 අනුව)
VII. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන - (ලකුණු පටිපාටියේ අනු අංක 06 )
   i) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ලකුණු පටිපාටියේ අංක 6 යටතේ ඔබ විසින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අධ්‍යාපන පර්යේෂණ හා ප්‍රකාශන වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීමේදී එම පර්යේෂණය/ප්‍රකාශනය කුමක්ද යන්න පැහැදිලිව සඳහන් කර ඇති පිටුව/පිටු එම ප්‍රකාශන වල කතෘ ලෙස ඔබගේ නම සඳහන් වන පිටුව/පිටු වල ආයතන ප්‍රධානි සහතික කරන ලද පිටපත් සමඟ අදාළ පර්යේෂණ හා ප්‍රකාශන වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

03. ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනයන්හි දකුණු පස ඉහළ කෙළවර ලකුණු පටිපාටියේ කුමන අනු අංකය යටතේ ලකුණු ලබා ගැනීමට ඉදිරිපත් කරන්නේද යන්න සඳහන් කර තිබිය යුතුය.

උදා - අධ්‍යාපන සුදුසුකම් සඳහා ඉදිරිපත් කරනු ලබන සහතික - අනු අංක 02

ඒ අනුව ඡායා පිටපත් ගොනුව සැකසීමෙන් පසු මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක 02 සම්පූර්ණ කර ගොනුව සමඟ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රසිද්ධ කර ඇති ලකුණු පටිපාටියේ දක්වා ඇති 'සටහන්' කෙරෙහි මනා අවධානයෙන් යුක්තව ලේඛන ඉදිරිපත් කළ යුතුය.


ගරු අමාත්‍ය / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk



Scanned with MOBILE SCANNER

04. මෙම සම්මුඛ පරීක්ෂණයේදී ඔබ දක්වනු ලබන කාර්ය සාධනය හා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් ද පදනම් කොට ලබන ලකුණු මත ලබා ගන්නා සමස්ත කුසලතාවයේ ප්‍රමුඛතාවය අනුව පමණක් විදුහල්පති තනතුරු පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත් කරනු ලැබීම සිදු වේ.

05. අයදුම්කරුවන් අදාළ අයදුම්පත්‍රයේ මනාපය පළකරන ලද ඕනෑම ජාතික පාසලක විදුහල්පති තනතුරකට පත්වීම් ලදහොත් අනිවාර්යයෙන්ම එම තනතුරෙහි රාජකාරි භාරගත යුතු බවත්, පිළිගත හැකි සාධාරණ හේතු නොමැතිව එම තනතුරේ රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කළ නොහැකි බවත්, පසුව අයදුම්පත්‍රයේ මනාපය වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා නොබලන බවත්, වැඩිදුරටත් දන්වමි.

06. සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම පමණක් පුරප්පාඩු වී ඇති ජාතික පාසලක විදුහල්පති තනතුරක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොවන බවද, දැනට පුරප්පාඩු වී ඇති ජාතික පාසල් විදුහල්පති තනතුරු සියල්ල සඳහාම නිලධාරීන් පත් කිරීමේ හෝ තනතුරු කිහිපයක් සඳහා පමණක් නිලධාරීන් පත් කිරීමේ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතු වන බව ද, වැඩිදුරටත් අවධාරණය කරමි.

අ.කළේ :- එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ආචාර්ය අයි.එම්.කේ.බී.ඉලංගසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) (රා.ආ.)
අධ්‍යාපන ලේකම් වෙනුවට

අවධානයට: නියමිත දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්යය බව ද සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමේදී ඉහත සඳහන් ලිපි ලේඛන සියල්ලම නිවැරදි ලෙස රැගෙන පැමිණිය යුතු බවද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙන් පසුව කිසිදු හේතුවක් මත කිසිදු ලේඛනයක් සුදුසුකම් සනාථ කිරීම සඳහා භාර නොගන්නා බව ද වැඩිදුරටත් අවධාරණය කරමි.

Scanned with
MOBILE SCANNER